TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබෑන්ක් පාර, කොළඹ 05.
2019.11.02

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජයේ දේපළ භාවිතා කිරීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට ලැබුණු පැමිණිල්ලකට අනුව 2019.10.31 වන දින රාජගිරියේ දී පැවැති ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ වාහන යොදා ගෙන ඇති බවට වාර්තා විය. එමෙන් ම ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ නම සහිත රතු පැහැති ධජ යොදා ගෙන තිබූ බවත් නිරීක්ෂණය විය. මේ සමග එයට අදාළ ඡායාරූප අමුණා ඇත.

මෙසේ රජයේ වාහන මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදාගැනීම මගින් 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 5 (i) යන නියමයන් උල්ලංඝනය වන අතර ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ දේපල යොදාගත් බව ද වාර්තා වේ. එබැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා බස්නාහිර පළාත් සම්බන්ධීකාරක සංජී අමා මෙනෙවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තූතියි.

මෙයට,

විශ්වාසී,

.....................................

ලක්විජය බණ්ඩාර

ජාතික සම්බන්ධීකාරක (PPPR)



